බදුල්ල ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 08 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු සඳහා බිල්කළ ආදායම රු.6,000,000 ක් වුවද, ගිණුමට රු.18,000,000 ක් ලෙස ගැලපීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් රු.12,000,000 ක් වැඩියෙන් දැක්වේ. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.7,726,225 ක් වුවද,එය ගිණුමට රු.8,000,000 ක් ලෙස දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී රු.358,854 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මත අපහරණය කරන ලද රු.85,900 ක් වටිනා භාණ්ඩ වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 127 වගන්තිය | සුසාන භූමි 25 කට අදාළ ඉඩම් මැන පවරාගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් මඟින් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට මැනුම් කර ගැනීම සඳහා යොමු කර ඇති අතර, මැනුම් කරගැනීමෙන් පසු පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ii)153(1) (අ), (ආ), (ඇ) වගන්ති හා 2016 දෙසැම්බර් 09 වැනි දිනැති අංක 1997 දරන ගැසට් පත්‍රය | සභා බල ප්‍රදේශයේ සංවර්ධනය නොකළ ඉඩම් සඳහා ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2 ක බද්දක් 2017 වර්ෂයේ දී පනවා අයකිරීමට අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද, සංවර්ධනය නොකළ ඉඩම් හඳුනාගෙන බදු අයකර ගැනීමට 2018 ඔක්තෝබර් 31 වන විටද කටයුතු කර නොතිබුණි. | | ඉදිරියේදී සමීක්ෂණයක් සිදුකර බදු අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක් සභාව කඩ කුලී තක්සේරු කළයුතු වුවද, සභාවට අයත් 2 කණුව පොදු වෙළඳ සංකීර්ණයේ පවතින කඩ කාමර 19 ක් 2012 වර්ෂයෙන් පසු තක්සේරු කිරීමෙන් තොරව බාහිර පාර්ශවයක් වෙත බදුදී තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී තක්සේරු කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,964,244 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,343,789 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,011,972 | 963,704 | 634,829 | 377,143 | 995,047 | 992,070 | 704,992 | 287,078 |
| (ii) | කුලී | 557,200 | 516,000 | 505,725 | 551,475 | 540,523 | 540,523 | 514,303 | 26,220 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 355,000 | 350,000 | 758,480 | 0 | 284,000 | 284,000 | 517,417 | 0 |
| (iv) | වෙනත් ආදායම් | 510,000 | 510,000 | 412,319 | 97,681 | 660,000 | 506,106 | 378,805 | 127,302 |
| | එකතුව | 2,434,172 | 2,339,704 | 2,311,353 | 1,026,299 | 2,479,570 | 2,322,699 | 2,115,517 | 440,600 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.2,339,704 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු.1,026,299 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කළ ආදායමෙන් සියයට 44 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | දේපල තහනම් කිරීම මඟින් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු හිඟ හිටිවරිපනම්,හිඟ හිටි ප්‍රාග්ධන ආධාර, හිඟ හිටි කඩ කුලී, හිඟ හිටි කසල බදු , හිඟ හිටි ජල සබඳතා ගාස්තු හා හිඟ හිටි ජල ගාස්තු වල එකතුව රු.2,766,891 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගත නොහැකි කඩ කුලී කපා හැරීමට හා අනෙකුත් ගාස්තු අය කරමින් පවතී. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති උසාවි දඩ රු.8,000,000 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | මුදල් නොලැබුණු මාස වලට අදාල උපලේඛන සකස් කර යවා ඇත. |

(ආ) <u>මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති මුද්දර ගාස්තුව රු.18,000,000 ක් අයකර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | මුදල් නොලැබුණු මාස වලට අදාල උපලේඛන සකස් කර යවා ඇත. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේදී තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------------------------- | --------------------- | --------------------------- |
| (අ) | සභාවට අයත් බැකෝ ලෝඩර් යන්ත්‍රය 2018 ඔක්තෝබර් 12 හා 19 යන දෙදින තුළ ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වතු ආශ්‍රිතව නිවාස ඉදිකිරීමේ වැඩසටහන සඳහා යන්ත්‍ර පැය 10.7 ක් සේවයේ යෙදවීම වෙනුවෙන් අය කරගත යුතුව තිබුණු රු.24,610 ක මුදල අය කරගෙන නොතිබුණි. | සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් එය හිමි හා කර්මාන්ත ණයහිමි ශේෂවල එකතුව රු.4,154,791 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරුවල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේදි ගෙවිය යුතු ශේෂ නිරවුල් කරමි. |

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------------- | ---------------------------- | ----------------------- |
| (අ) | වසර 30 ක කාලයක සිට බදුල්ල ප්‍රාදේශීය සභාව විසින් වේවැස්ස වත්තට අයත් බිම් කොටසකට කසල බැහැර කළද මෙකී ඉඩම් කොටස 2018 ඔක්තෝබර් 31 දින දක්වා සභාවට පවරාගෙන නොතිබුණි. | සභාවට අදාල ඉඩම නිදහස් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 22 (ඕ) ඡේදය ප්‍රකාරව සහ 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීමට ප්‍රාදේශීය සභාව කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | දිරන කසල ප්‍රතිචක්‍රීකරණය කර ඒවා ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීම පිළිබඳ කසල කළමනාකරණ වැඩ පිළිවෙල ප්‍රාදේශීය සභාව විසින් සකස් කර නොතිබුණි. | දිරන කසළ ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

3.4 ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරමින් පවති. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේදී අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කරමි. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක්වත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | ඉදිරියේදී කාර්තුවකට එක බැගින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි. |